<u>**ශ්‍රී ලංකා තොරතුරු හා සන්නිවේදන තාක්ෂණ සේවයේ 3 පන්තියේ I ශ්‍රේණියේ නිලධාරීන් සඳහා වන කාර්යක්ෂමතා කඩඉම් විභාගය - 2018(II)2023**</u>

**උක්ත විභාගයට අයදුම්කරන ලද සියලු නිලධාරීන් වෙත,**

අංක 2,331 සහ 2023.05.04 දිනැති ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ගැසට් පත්‍රයේ පළ කරන ලද උක්ත කාර්යක්ෂමතා කඩඉම් විභාගයට අදාළ නිවේදනය අනුව එම විභාගය 2023.06.11 දින පැවැත්වීමට ශ්‍රී ලංකා සංවර්ධන පරිපාලන ආයතනයේ අධ්‍යක්ෂ ජනරාල් විසින් මේ වනවිට කටයුතු කරමින් පවතී.

02. එම විභාගයට අයදුම් කිරීමට සුදුසුකම් ලැබීම සම්බන්ධ පහත කරුණු වෙත අවධානය යොමු කරවමි.

I. එම විභාගය සඳහා අයදුම්කිරීමට සුදුසුකම් ලබන්නේ ශ්‍රී ලංකා තොරතුරු හා සන්නිවේදන තාක්ෂණ සේවයේ 3 පන්තියේ I ශ්‍රේණියේ නිලධාරීන් පමණක් වේ.

II. ඒ හැරුණුවිට ශ්‍රී ලංකා තොරතුරු හා සන්නිවේදන තාක්ෂණ සේවයේ 3 පන්තියේ I ශ්‍රේණියට උසස්වීමට අවශ්‍ය සියලු සුදුසුකම් විභාගයේ අයදුම්පත් කැඳවන අවසාන දින වන විට සෑම ආකාරයකින් ම සම්පූර්ණ කර ඇති නමුත් මෙතෙක් කුමන හෝ ප්‍රමාදයක් මත අදාළ උසස්වීම් ලිපිය ලබා ගැනීමට නොහැකි වූ නිලධාරීන් උක්ත විභාගයට අයදුම් කර ඇත්තේ නම් එම නිලධාරීන් ද එම විභාගය සඳහා අයදුම්කිරීමට සුදුසුකම් ලැබුවන් සේ සලකා බැලිය හැකිය.

03. එහෙත් ඉහත කාණ්ඩ දෙකටම අයත් නොවන මෙම විභාගයට අයදුම් කිරීම සඳහා සුදුසුකම් ලබා නොමැති ශ්‍රී ලංකා තොරතුරු හා සන්නිවේදන තාක්ෂණ සේවයේ නිලධාරීන් මෙන්ම වෙනත් සේවාවල නිලධාරීන් ද ඉතා සැලකිය යුතු ප්‍රමාණයක් මෙම විභාගය සඳහා අයදුම්කර ඇති බව අපේක්ෂිත ප්‍රමාණයට වඩා ප්‍රමාණයක් මෙම විභාගයට අයදුම් කිරීම තුළ නිරීක්ෂණය වේ.

04. එම තත්ත්වය යටතේ මෙම විභාගයට අයදුම් කිරීමට සත්‍ය ලෙස ම සුදුසුකම් ලබන නිලධාරීන් හඳුනාගැනීම සඳහා ගූගල් පෝරමයක් (Google Form) හඳුන්වා දෙනු ලබන බව සැලකුව මැනවි. ඒ අනුව උක්ත 02. I සහ II ඡේද අනුව මෙම විභාගයට අයදුම් කිරීම සඳහා සුදුසුකම් ලබන නිලධාරීන් පමණක් පහත සබැඳිය මගින් ගූගල් පෝරමයට ඇතුළු වී එය පුරවා එවීම (Submit) මගින් ඔවුන් උක්ත විභාගය සඳහා පෙනී සිටීමට නිශ්චිතවම සුදුසුකම් ලබන නිලධාරීන් බව සනාථ කළ යුතු වේ. එම නිලධාරීන්ට පමණක් විභාගයට පෙනී සිටීමට ඉඩ සලසන ලෙස ශ්‍රී ලංකා සංවර්ධන පරිපාලන ආයතනයේ අධ්‍යක්ෂ ජනරාල් වෙත දැන්වීමට මා විසින් කටයුතු කරනු ලැබේ.

https://bit.ly/3BVdBky

**පෝරමය පිරවීම සඳහා 2023.05.29 දින සිට 2023.05.31 දින මධ්‍යම රාත්‍රී 12 දක්වා පමණක් කාලය ලබා දෙනු ලැබේ.**

05. විභාගයට අයදුම් කිරීමට සුදුසුකම් නොලබන කිසියම් හෝ නිලධාරියෙකු මෙම විභාගය සඳහා අයදුම් කර ඇත්නම් ඒ සම්බන්ධව පත්වීම් බලධරයා ලෙස මා විසින් ගනු ලබන ක්‍රියාමාර්ගවලට අනුව එම නිලධාරීන් කටයුතු කළ යුතු බව ද වැඩිදුරටත් දන්වමි.

එස්. ආලෝකබණ්ඩාර
ඒකාබද්ධ සේවා අධ්‍යක්ෂ ජනරාල්